දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී, ඒ පිළිබඳ විශේෂ සැලකිලිමත් වීමක් හා ආචාර ධාර්මික වීමක් තිබීම අවශ්‍ය වන්නේ, ආචාර ධාර්මික නොවන ලෙසින් දිවි තොර කරගැනීම් වාර්තා කිරීම් ඔස්සේ ද, දිවි තොර කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යා හැකි බැවිනි.

උදාහරණයක් ලෙසට, මහනුවර ප්‍රදේශයේ සිසුවියක් දිවි තොර කරගත්තේ යැයි සැක කෙරෙනා සිදුවීමක් මුද්‍රිත හා රූපවාහිනී මාධ්‍ය තුළ ආවරණය වී තිබූ ආකාරය ගෙන බලමු.

1) පුවත්පත් දෙකක මුල් පිටුවේ ප්‍රමුඛතාවයකින් යුතුව මෙම සිදුවීම වාර්තා වී තිබිණි. දිවි තොර කරගැනීම් සම්බන්ධ සිදුවීම් ප්‍රමුඛතාවයකින් යුතුව පළ කිරීම ඔස්සේ, ඊට වැඩි අවධානයක් යොමු වීමත්, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අයෙකු හට එය සෘණාත්මක බලපෑමක් කිරීමත් සිදුවිය හැක.

2) දිවි තොර කරගත් අයගේ ඡායාරූපය සහ නම එක් පුවත් වාර්තාවක පළ වී ඇත. එයින්, දිවි තොර කරගත් අයගේ පවුලේ සාමාජිකයන් තුළ එම සිදුවීම නිසාත්, දිවි තොර කරගැනීම් හා බැඳුනු සමාජ අගතිය නිසාත්, දැනටමත් ඇති වී තිබිය හැකි සිත් වේදනාවන් සහ මානසික පීඩාවන් වැඩිදියුණු විය හැක.

3) අරුණ හැරෙන්නට අනෙක් පුවත් සමඟින් උපකාරක අංක සඳහන්ව නොතිබුණි. දිවි තොර කරගැනීම් පිළිබඳ වාර්තාවන් සමග උපකාරක අංක දැක්වීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයක් ඇති අයෙකුගේ ජීවිතයක් ගලවා ගැනීමට දායකත්වයක් ලැබිය හැක. මෙහිදී අරුණ පුවත්පත එම ලිපිය හා හදිසි උපකාරක අංක පළ කොට තිබීම ප්‍රශංසා කටයුතු වෙයි.

වර්තමානයේදී, දිවි තොර කරගැනීම් සමාජ සෞඛ්‍ය ගැටළුවක් බවට පත්ව තිබේ. එනිසා, එය හැකිතාක් දුරට පාලනය කිරීමට මාධ්‍ය ඔස්සේද සහාය අත්‍යන්තයෙන්ම ලැබිය යුතු වේ. ඒ සඳහා මාධ්‍ය විසින් ලබාදිය හැකි දායකත්වය වන්නේ, හැකිතාක් ප්‍රවේසම් සහගත හා ආචාර ධාර්මික ලෙස මෙවැනි සිදුවීම් වාර්තා කිරීමයි.

(දක්වා ඇති සිංහල භාෂා පුවත්පත් වල සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ එම දිනයන් තුළදී මෙම සිදුවීම වාර්තා වී නොතිබුණි)

හදිසි උපකාරක අංක:
CCCline - 1333
ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
ජාතික මානසික සෞඛ්‍ය ආයතනය - 1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවිඩ මාර්ගයෙන් සම්බන්ධ කර ගත හැක)

මූලාශ්‍ර:
https://www.hhs.gov/.../what-does-suicide.../index.html
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...